අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 464

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 (VIII) 02 (ආ) අනුව (රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම හැර අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම මත) උසස්වීම් ලබාදුන් නිලධාරීන්ට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වැටුප් වර්ධක ගෙවීම.</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 (VIII) 02 (ආ) පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම හැර අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම මත උසස්වීම් ලබාදුන් නිලධාරීන්ට ඔවුන්ගේ උසස්වීමට අදාල වැටුප් පරිවර්තනය කිරීමෙන් පසු ඉන් ඔබ්බට වන වැටුප් වර්ධක අනෙකුත් රාජ්‍ය භාෂා අවශ්‍යතාව සම්පූර්ණ කරන තෙක් නතර වන බව උසස් කිරීම් ලිපි වල සඳහන් කරන ලදී.

02. අනතුරුව ඔවුන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීමෙන් පසුව උසස්වීම් ක්‍රියාත්මක වූ දින සිට රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කරන ලද දින දක්වා වූ කාලය සඳහා වැටුප් වර්ධක, ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 10:2 හා 10:3 වගන්ති ප්‍රකාරව "නතර" වන්නේද නැතහොත් කිසිදු අඩු කිරීමකින් තොරව වැටුප් වර්ධක ගෙවීමට හැකියාවක් ඇතිද යන්න පැහැදිලි කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලා සිටින ලදී.

03. ඊට අදාළව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත එවන ලද 2023.06.19 දිනැති ලිපියෙහි 02 වන ඡේදය, සියලුම උපලේඛනගත රජයේ නිලධරයන්ගේ දැනගැනීම සඳහා පහත පරිදි උපුටා දක්වමි.

*" රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 (VIII) හි 02 (ආ) ඡේදයේ සඳහන් විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් තොරව ශ්‍රේණි උසස්වීම් ලැබූ නිලධරයන් විසින් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ලබා දී ඇති සහන කාලය තුළ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව එකී අවශ්‍යතාව සම්පූර්ණ කළ පසුව එම නිලධරයන්ගේ උසස්වීම් සහ නොගෙවා නතර කරන ලද වැටුප් වර්ධක නැවත ප්‍රතිස්ථාපනය කළ හැකි බව කාරුණිකව දන්වා සිටිමි "*

04. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 (VIII) 02 (ආ) පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කිරීම හැර අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම මත උසස්වීම් ලබාදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පසුව සම්පූර්ණ කරන නිලධාරීන්/ නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඉහත 03 ඡේදයේ උපදෙස් අනුව ක්‍රියා කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දන්වමි.

එච්.සංජීව සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2023 සැප්තැම්බර් මස 01 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12